# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2247/11 - 2021 සැප්තැම්බර් මස 29 වැනි බදාදා - 2021.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**දකුණු පළාතේ පළාත් සභාව**

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1) වගන්තිය සමග කියවිය යුතු 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 248 වගන්තිය ප්‍රකාරව කරනු ලබන නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021.08.10 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2240/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද,

ඉන් පෙර තංගල්ල නගර සභාවේ ගරු සභාපතිවරයා වෙත දී ඇති නියෝගයන් දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා වෙත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය සමග කියවිය යුතු 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත පරිදි සංශෝධනය කරනු ලබන බව දැනුම් දෙමි.

''තංගල්ල නගර සභාවට අයත් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වන මූල්‍ය අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම උදෙසා 2020.12.07 දින තංගල්ල නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් යෝජිත වියදම් පිළිබඳ ඇස්තමේන්තුවෙන් පුනරාවර්තන වියදම් සඳහා මුදල් වියදම් කිරීම පමණක් සිදු කිරීමටත්, කවර හෝ ප්‍රාග්ධන වියදමක් සඳහා මුදල් වැය කිරීමක් අවශ්‍ය වන්නේ නම් එය සභා සම්මතයක් මගින් සිදු කරවා ගන්නා ලෙසටත්, මෙයින් තංගල්ල නගර සභාවේ ගරු සභාපතිවරයා වන වර්ණකුලසූරිය පටබැඳිගේ ආරියදාස යන අය හට විධාන කරමි.''

**ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2021 ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින,
ගාල්ල පහළ ඩික්සන් පාර පිහිටි,
දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

10-115